www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජවිපෙ - ශ්‍රීලනිප සන්ධානය ශ්‍රී ලංකාවේ දේශපාලන ආතතීන් උග්‍ර කරයි

## JVP-SLFP alliance heightens political tensions in Sri Lanka

**විලානි පීරිස් සහ කේ. රත්නායක විසිනි**
**2004 පෙබරවාරි 03**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), අතර සන්ධානයක් ගොඩනැගීමට ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග තීරනය කිරීමත් සමග ම ශ්‍රී ලංකාවේ දේශපාලන ආතතීන් වඩාත් තීව්‍ර වී ඇත. සමහර අවස්ථාවල දී සමාජවාදී පක්ෂයක් ලෙස පෙනී සිටින ජවිපෙය, විවෘතවම සිංහල ස්වෝත්තමවාදයට ආයාචනා කරන අතර, රටේ දිගඇදුනු යුද්ධය නිමා කිරීම සඳහා දෙමල විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) සමග එකඟතාවයක් ඇති කර ගැනීමේ ඊනියා සාම ක්‍රියාවලියට සතුරුව සිටි.

එක්සත් ජාතික පෙරමුනු ආන්ඩුව (එජාපෙ) පෙරලා දැමීම ප්‍රකාශිත අරමුන කර ගත් එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) පිහිටුවීම සඳහා ශ්‍රීලනිප මහ ලේකම් මෛත්‍රීපාල සිරිසේන සහ ජවිපෙ ලේකම් ටිල්වින් සිල්වා, ජනවාරි 20 දා කොලඹ දී අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබූහ. ලියවිල්ලේ මුල් කොටසින් වෙනම දෙමල රාජ්‍යයක් සඳහා පදනම සකසා දීම, රටේ ආර්ථිකයේ පදනම විනාශ කර දැමීම, සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතනයන්ගේ යටහත් සේවකයෙකු වීම සම්බන්ධයෙන් එජාපෙ හෙලාදැක තිබේ. එහි බලමුලු ශක්තිමත් කර ගැනීම සඳහා එජනිස පසුගිය බ්‍රහස්පතින්දා කොලඹ දී ප්‍රසිද්ධ රැලියක් පැවැත්වී ය.

ශ්‍රීලනිප-ජවිපෙ සන්ධානය, දැනටමත් අස්ථාවර ව ඇති කොලඹ දේශපාලන තත්වයට නව හා විභවාත්මකව පුපුරන සුලු සාධකයක් එක්කරයි. ආන්ඩුව සහ ජනාධිපතිනිය අතර රාජ්‍ය බලයේ ලීවරයන් ක්‍රියාකරවන්නේ කව්රුන්ද යන්න මුල්කරගෙන පැනනැගුනු දේශපාලන ගැටුම දැනටම මාස 3ක කාලයක් කිසිදු විසඳුමක ලක්ෂනයකුදු නොදකිමින් දිග්ගැස්සී ඇත. මිලිටරියේ ඉහල කොටස් සහ නොයෙක් සිංහල අන්තවාදී කන්ඩායම් මත වාරුවෙමින් ජවිපෙ කල බලකිරීම් මධ්‍යයේ නොවැම්බර් 4 වන දා කුමාරතුංග ප්‍රධාන අමාත්‍යංශ තුනක පාලනය තමන් යටතට ගනිමින්, පාර්ලිමේන්තුව කල්තබා හදිසි නීතිය ප්‍රකාශ කිරීමට සැරසුනා ය. ආන්ඩුව එල්ටීටීඊයට නිදහසේ ක්‍රියා කිරීමට ඉඩහරිමින් රටේ ජාතික ආරක්ෂාව අනතුරේ හෙලී යැයි ඇය චෝදනා කලා ය.

ප්‍රධාන බලවතුන්ගේ බලපෑම් මධ්‍යයේ කුමාරතුංග පසුබැස්සා ය. සිය ආර්ථික සහ මූලෝපායික බලාපොරොත්තුවලට, ශ්‍රී ලංකාවේ පමනක් නො ව මුලු දකුනු ආසියාතික කලාපය තුලම බාධාව ඇති රටේ සිවිල් යුද්ධය අවසන් කිරීමට වොෂින්ටනය විශේෂයෙන් ම අරමුනු කරගෙන සිටි. විදේශීය ආයෝජනයන් දිරිගැන්වීමත් භූගෝලීය නිෂ්පාදන ක්‍රියාවලිය තුලට රට සමීපව ඒකාබද්ධ කිරීමත් අරමුනු කරගනිමින්, මහා ව්‍යාපාරිකයන්ගෙන් කොටසකට ද යුද්ධයේ නිමාවක් දැකීමට අවශ්‍ය ය. කම්කරු පන්තිය බෙදා වෙන් කරමින් තම පාලනය රැක ගැනීම සඳහා, දශක පහකටත් වැඩි කලක් දෙමල විරෝධී වර්ගවාදය ප්‍රයෝජනයට ගත් පාලක ප්‍රභූව තුල එල්ටීටීඊය සමග සාම සාකච්ඡා පැවැත්වීම, තියුනු ආතතීන් පුපුරුවා හැර තිබේ.

එකතැන පල්වීමේ දේශපාලන තත්වය මාස තුනක් ඉක්මවා ගොස් ඇත. එල්ටීටීඊය සමග පසුගිය අප්‍රේල් මාසයේ දී ඇනහිටි සාකච්ඡා නැවත ආරම්භ වී නොමැත. තියුනු අන්තර් ජාතික බලපෑම් හමුවේ පවා, කුමාරතුංග සහ අගමැති රනිල් වික්‍රමසිංහ අතර පැවති සාකච්ඡා කිසිදු එකඟතාවකට පැමිනීමට අපොහොසත් ව පසුගිය දෙසැම්බරයේ දී බිඳ වැටුනි. ප්‍රශ්නයට මුල් වූ ප්‍රධානතම කරුන ආරක්ෂක අමාත්‍යංශයේ පාලනය යි. ජනාධිපතිනිය එය අතහැරීම ප්‍රතික්ෂේප කල අතර එල්ටීටීඊය සමග නැවත සාකච්ඡා ආරම්භ කිරීම සඳහා ආන්ඩුවට එය අත්‍යවශ්‍ය බව අගමැතිවරයා අවධාරනය කලේ ය.

මෙම අර්බුදය මධ්‍යයේ ශ්‍රීලනිපයේ කොටසක්, ජවිපෙ සමග සන්ධානයකට එලඹීම මගින් පක්ෂයට සහයෝගය වර්ධනය කර ගනිමින් ඉක්මන් මැතිවරනයකට එලඹෙන ලෙස කුමාරතුංගට බලපෑම් කරන්නට විය. ශ්‍රීලනිපයේ අනෙක් කොටස් සහ පොදු පෙරමුනේ (පොපෙ) අනෙක් හවුල්කරුවන් - ලංකා සමසමාජ පක්ෂය (ලසසප) සහ ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය (ශ්‍රීලංකොප) - ජවිපෙ සමග සන්ධානයට එලඹීමේ ඇති අවදානම, විශේෂයෙන්ම යුද්ධය අවසන් කිරීම සඳහා එල්ටීටීඊය සමග මොන ම එකඟතාවකට හෝ එලඹීමට ඇති ඉඩකඩ අවුරා දමනු ඇතැයි පෙන්වා දෙති. ශ්‍රීලනිප පාර්ලිමේන්තු මන්ත්‍රී චන්දන කත්‍රිආරච්චිට අනුව, එවැනි පියවරකට එරෙහිව මන්ත්‍රීවරු 45 කගේ අත්සන් සහිත පෙත්සමක් කුමාරතුංගට යොමු කර ඇත.

ශ්‍රීලනිපය තුල මෙම ගැටුම් සිදුවෙන අතරතුර, ජවිපෙ සමග එකඟතාවකට පැමිනීම මාස ගනනක්

තිස්සේ වරින් වර උඩ එමින් සහ යටයමින් පැවතුනි. කුමාරතුංග සත්‍යය වසන් කිරීමේ තැතක යෙදුනා ය. ජනාධිපතිනිය ජවිපෙ සමග එකඟතාවකට එලඹීමට අවසානයේ අනුමැතිය දුන්නේ ආන්ඩුව සමග පැවති සාකච්ඡා ප්‍රතිඵලයක් ගෙන ඒමට අපොහොසත්ව පසුගිය දෙසැම්බරයේ දී නවතා දැමීමෙන් පසුව ය. කුමාරතුංග පවතින තත්වය පිලිගැනීම සඳහා එජාපෙ නම්මා ගැනීමේ මාධ්‍යයක් ලෙස, ජවිපෙය යොදා ගැනීමට උත්සාහ ගන්නා ආකාරයක් දක්නට ලැබේ. අවබෝධතා ගිවිසුම අත්සන් තැබීමේ උත්සවයට සහ ගිය සතියේ පැවති ඒකාබද්ධ රැලියට සහභාගි නො වී ඇය, ජවිපෙන් දුරස්ථව සිටියා ය. ඒ අතර ම ඇය ආන්ඩුව සමග යලි සාකච්ඡා ආරම්භ කර ඇත. පලමු රැස්වීම ජනවාරි 23 දා පැවති අතර අද දිනයේ ද සාකච්ඡා පැවැත්වීමට නියමිත ය.

එය ඉතා අන්තරායකාරී ක්‍රමවේදයකි. කුමාරතුංග ආන්ඩුව සමග එකඟතාවකට එලඹීමට සමත් වුවහොත්, ජවිපෙ-ශ්‍රීලනිප සන්ධානය ඉක්මනින්ම බිඳවැටීමට ඉඩ ඇත. ඇයගේ සහෝදරයා අනුර බන්ඩාරනායක විසින් නායකත්වය දෙන ශ්‍රීලනිපයේ කොටසක් ජවිපෙ ය සමග ගමන් කිරීමට ද ඉඩ ඇත. එසේම කුමාරතුංග-වික්‍රමසිංහ සාකච්ඡා බිඳවැටුනහොත්, නියමිත කාලයට පෙර මැතිවරනයක් කැඳවන ලෙස කුමාරතුංග මත යෙදෙන පීඩනය ඉහල නගින අතර, ජවිපෙය එම අවස්ථාව එහි තැන වර්ධනය කර ගැනීමට යොදාගනු ඇත. කුමන ආකාරයක හැරීම් සහ පෙරලීම් සිදු වුව ද, කොලඹ දේශපාලනය තුල ජවිපයේ වර්ධනය වූ භූමිකාව, එල්ටීටීඊය සමග සම්මුතියකට එලඹීමට ඇති ඉඩකඩ සීමා කරන අතර නැවත විවෘත යුද ගැටුමට අවතීර්නවීමේ අවදානම වර්ධනය කරයි.

## ජවිපෙ භූමිකාව

ශ්‍රීලනිපය සමග ගොඩනැගූ සන්ධානය තුලින් ජවිපෙය බලාපොරොත්තු වන්නේ, තමන් දේශපාලන සන්ස්ථාපිතයේ කොටසක් ලෙස තහවුරු වීමටත් තමන්ගේම පාලනයක් සඳහා වන පදනම සකසා ගැනීමටත් ය. 1994 සිට 2001 දක්වා බලයේ සිටි පොදු පෙරමුනෙහි (පොපෙ) ප්‍රධාන පක්ෂය ලෙස, ශ්‍රීලනිපය, යුද්ධය අවසන් කිරීමට සහ ජීවන තත්වයන් ඉහල දැමීමට දුන් සිය මැතිවරන පොරොන්දු ඉටුකිරීමට අපොහොසත්වීම හේතුවෙන් සිය පදනම් දුබල කර ගත්තා ය. ප්‍රධාන පක්ෂ දෙක මගින් ම ක්‍රියාවට නගනු ලැබූ ආර්ථික ප්‍රතිව්‍යුහකරන ක්‍රියාදාමය තුල තමන්ව නොතකා හැර ඇතැයි සලකන සුලු ව්‍යාපාරික හා වැඩකරන ජනතාව ජවිපෙය විසින් ගසාකන ලදි. 2001 දී පැවති මැතිවරනයේ දී එය ආසන 16ක් දිනාගත්තේ ය.

මාවෝවාදය, චේ ගුවේරාවාදය සහ සිංහල ස්වෝත්තමවාදයේ මිශ්‍රනයක පදනම මත, අපේක්ෂාභංගත්වයට පත් ගම්බද සිංහල තරුනයන්ට ආමන්ත්‍රනය කරමින් 1960 ගනන්වල දී ජවිපෙය බිහි කරනු ලැබුයේ, ලසසපය විසින් ජාත්‍යන්තර සමාජවාදී වැඩපිලිවෙල අතහැර දමමින් 1964 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආන්ඩුවට එක්වීමෙන් පසු කාලයේ ය. කෙසේ වෙතත්, පසුගිය දශක තුනක කාලය තුල, ජවිපෙ විසින් එහි සමාජවාදී පුරසාරම් බොහෝ දුරට ඉවත දමමින්, වර්ගවාදයේ වඩාත්ම උමතු රූපාකාරයන් වැලඳගත් අතර එන්න එන්නම මහ ව්‍යාපාරිකයන්ගේ අවශ්‍යතාවන් සමග ගැලපී ගත්තේ ය.

ශ්‍රීලනිපය සමග සන්ධානයක් ගොඩනැගීම මගින්, ආර්ථික ප්‍රතිව්‍යුහකරනය සහ වෙලඳ පොල ප්‍රතිසංස්කරනයට ජවිපෙ අනුගතවීමේ තවත් ඉදිරි පියවරක් සනිටුහන් කරයි. අවබෝධතා ගිවිසුම ගොවීන්ගේ, ව්‍යවසායකයන්ගේ සහ කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතාවන්ට ආමන්ත්‍රනය කල ද, එය "අන්‍යෝන්‍ය සුබසිද්ධිය සැලසෙන පරිදි විදේශීය ප්‍රාග්ධන ආයෝජනයන් වර්ධනය කර ගැනීම" අරමුනු කරගෙන සිටින බව ද කියා සිටී. වඩාත් කැපී පෙනෙන්නේ, ශ්‍රීලනිපයේ පෞද්ගලීකරනය පිලිබඳ වාර්තාව, පොදු වියදම් දැඩි ලෙස කපා හැරීම සහ අනෙක් ප්‍රතිව්‍යුහකරන පියවරයන් හෙලා දැකීම ජවිපෙය විසින් අතහැර දැමීම යි.

ජවිපෙ ආර්ථික වැඩපිලිවෙල පිලිබඳ යම් සැකයක් පැවතියේ නම්, පිටුවහලේ සිටි ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ, ලන්ඩනයේ සිට ශ්‍රී ලංකාවට පිටත්වීමට සුලු මොහොතකට පෙර, තම පක්ෂය "දූෂනයෙන් තොර ප්‍රජාතන්ත්‍රවාදී ධනවාදී ක්‍රමයක්" සඳහා පෙනී සිටින්නේ යැයි *ඒෂියන් ට්‍රිබියුන්* සඟරාවට කල ප්‍රකාශයෙන් පහවී යයි. එජනිස ආන්ඩුවක් යටතේ "මැලේසියාව, ඉන්දියාව සහ චීනය ආදී ආසියානු රටවල අඩිපාරේ යමින් ශ්‍රී ලංකාව හැකි උපරිම අයුරින් සංවර්ධනය කිරීම සඳහා, ව්‍යවසායකයන්, මින් පෙර නො වූ විරූ වාසිදායක ස්ථානයක පිහිටුවාලන බව" ඔහු අවධාරනය කලේ ය. ශ්‍රී ලංකාව "ආසියානු ව්‍යාග්‍රයෙකු" බවට පත්කිරීමට එල්ටීටීඊය දිවුරුම් දුන්නා සේ ම, විදේශීය සහ දේශීය සමාගම්වලට එක සේ සූරා කෑ හැකි ලාභ ශ්‍රම වේදිකාවක් බවට මෙම දිවයින පෙරලීමට, ජවිපෙ පොරොන්දු දෙයි.

ආර්ථිකය යලි පුනර්ජීවනය කිරීමේ ශ්‍රීලනිප-ජවිපෙ සැලසුම තුල "රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශය තුල ම" ඵලදායීතාව වර්ධනය කිරීම, සහ "නවීන පරිපාලන ක්‍රම" පිලිගන්නා ලෙස කම්කරුවන්ගෙන් ඉල්ලුම් කෙරෙ යි. පක්ෂයේ ආර්ථික පිලිවෙත සාධාරනීකරනය කරමින් ලාභ ඉපයීම සඳහා වන සියලු බාධකයන් ඉවත් කල යුතු යැයි අමරසිංහ *ඒෂියන් ට්‍රිබියුන්* සඟරාවට කියා සිටී. ව්‍යාපාරයන්ට ලාභයක් නොමැති කල, සේවකයන්ගේ වැටුප් ගෙවීමට හාම්පුතුන්ට නො හැකි වන අතර ව්‍යාපාර වැඩි කලක් පවත්වාගෙන යාමට ද අපොහොසත් වෙතැ යි ඔහු පැවසී ය. බුදුන්ගේ ඉගැන්වීම් අනුව යමින් ඔහු "පියකු තම දරුවන්ට සලකන ආකාරයෙන් සේවකයන්ට සලකන්නැයි" හාම්පුතුන්ගෙන් ඉල්ලා සිටියේ ය.

ආර්ථික පිලිවෙත සම්බන්ධයෙන් ශ්‍රීලනිප සහ ජවිපෙ අතර සැලකිය යුතු විසම්මුතියක් නොමැති වුව ද, සිවිල් යුද්ධය සම්බන්ධයෙන් තියුනු වෙනස්කම් පවතී. පක්ෂ දෙකම එල්ටීටීඊය සමග "නිවැරදි සාකච්ඡාවකට" එලඹීම යෝජනා කරන නමුදු, ඇන්නක පදනම සම්බන්ධයෙන් වෙනස් වූ ස්ථාවරයන් දරයි.

අවබෝධතා ගිවිසුම තුල "අවසාන විසඳුමක් සම්බන්ධයෙන් වෙනස් ස්ථාවරයන් දැරීම මෙම බරපතල අර්බුදයට විසඳුමක් කරා එලඹීමේ දී" එක්ව ගමන් කිරීමට ඔවුන්ට බාධාවක් නො වනු ඇතැයි, සඳහන් කරමින් සියලු නො එකඟතාවන් සුලුවෙන් පැත්තකට තල්ලු කරයි.

නමුත් මෙම සන්ධානයේ දැඩි අස්ථාවරත්වයට මුල්වන සාධකය ද හරියට ම, එය යුද්ධය සම්බන්ධයෙන් දරන මෙම "පරස්පරතාවය" යි. උතුරු සහ නැගෙනහිර පලාත්වලට බලය විමධ්‍යගත කිරීම සඳහා කුමාරතුංගගේ සහ ශ්‍රීලනිපයේ යෝජනා එජාපෙ ආන්ඩුවේ යෝජනාවලට එතරම් වෙනස් නො වේ. සැලසුම කම්කරු පන්තිය අන්‍යොන්‍ය ලෙස සූරාකෑම සඳහා සිංහල සහ දෙමල ධනපති පන්තිය අතර වාර්ගික පදනම් වන බලය බෙදාගැනීමේ වැඩපිලිවෙලක් සඳහා ය. එජාපෙ හි සැලසුම වැලඳ ගැනීමට කුමාරතුංගගේ අකමැත්ත මගින් පෙන්නුම් කෙරෙන්නේ, දෙමල සුලුතරයට යම් හෝ සහනයන් ලබාදීමට එරෙහිව සිංහල අන්තවාදීන් විසින් සිදු කරන උද්ඝෝෂනයන් සම්බන්ධයෙන් ප්‍රධාන පක්ෂ දෙක ම දක්වන සංවේදී බව යි.

ජවිපෙ පලාත් සභාවන්ට බලය විමධ්‍යගත කිරීමේ සැලසුමකට විරුද්ධ වන අතර "පරිපාලන කටයුතු ප්‍රාදේශීය ආයතනවලට විමධ්‍යගත කිරීමක්" යෝජනා කරයි. මෙය අර්ථදැක්වීමේ සරල වෙනසක් නො වේ. එල්ටීටීඊය සම්බන්ධයෙන් සැලකීමේ දී වැඩි බලතල සහිත උතුරු-නැගෙනහිර ඒකාබද්ධ පලාත් සභාවක් පාලනය සහ නගර සහ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රාදේශීය නිලධාරීන්ගේ කටයුතුවලට කොටු කිරීම අතර දැවැන්ත වෙනසක් පවතී. මෙවැනි පදනමක් මත එල්ටීටීඊය සාකච්ඡාවන්ට එකඟවීමට ඇත්තේ සුලු ඉඩක් වන අතර එය නැවත යුද්ධයට එලඹීම සඳහා වේදිකාව සකස යි. ජවිපෙ කතා කරන්නේ එල්ටීටීඊය සමග කිසිදු අතරමැදි විසඳුමකට එලඹීමට සූදානම් නැති පාලක ප්‍රභූවට ය.

ගිවිසුම අත්සන් කල දිනයේ සිට ම ශ්‍රීලනිපය සහ ජවිපෙ අතර වෙනස්කම එලිපිට ප්‍රදර්ශනය වෙයි. ජ්‍යෙෂ්ඨ ජනාධිපති උපදේශක ලක්ෂ්මන් කදිරගාමර් එල්ටීටීඊයේ අන්තර්වාර පාලන මන්ඩලය සඳහා වූ යෝජනාවලිය සන්ධානයට පිලිගත නො හැකි වුවත් තමන් "කොන්දේසිවලින් තොරව ඒ සියල්ල සාකච්ඡා මේසයේ දී කතා කිරීමට සූදානම්" යැයි පැවසී ය. කෙසේ වෙතත් ජවිපෙ නායක අමරසිංහ පසුගිය සති අන්තයේ ස්වාධීන රූපවාහිනී නාලිකාවේ පෙනී සිටිමින් එල්ටීටීඊ යෝජනාවන් "සාකච්ඡාවට බඳුන් කල නො හැකි" යැයි පැවසී ය.

ජවිපෙ-ශ්‍රීලනිප සන්ධානය බිහි කල තැන් පටන් ආන්ඩුව සමග එකඟතාවකට එලඹෙන ලෙස කුමාරතුංග වෙත තියුනු බලපෑම් එල්ලවෙමින් තිබුනි. අවබෝධතා ගිවිසුම අත්සන් කෙරුනු දිනය තුල පැය තුනක ගනුදෙනුවල දී කොලඹ කොටස් වෙලඳ පොලේ අගය රුපියල් බිලියන 9.3 (ඇ.ඩො. මිලියන 95) කින් පහත වැටීම මගින් මහව්‍යාපාරිකයන්ගේ ප්‍රතික්‍රියාව පෙන්නුම් කෙරිනි. මහබලවතුන් නියෝජනය කරමින් ජපානයේ විශේෂ නියෝජිත යසුෂි අකාෂි සන්ධානය "කනස්සල්ලට හේතුවක්" බවත්, අන්තර්ජාතික ප්‍රජාව ජනාධිපතිනිය සහ අගමැතිවරයා ගැටුමේ අවසානයක් දැකීමට උනන්දු සහගත බව ද, කොලඹ දී පැවසී ය.

පෙබරවාරි 17 දා වොෂින්ටනයේ දී ආධාර දෙන රටවල කන්ඩායම රැස්වීමට නියමිත අතර එහි දී ශ්‍රී ලංකාවේ සාම ක්‍රියාදාමයේ ප්‍රගතිය සහ රටට ලබාදෙන මූල්‍ය ආධාර පිලිබඳව සමාලෝචනය කිරීමට නියමිත ය. කොලඹ ඒකාබද්ධ ව්‍යාපාරික සන්සදය රට නැවත ගොඩනැංවීම සඳහා ලබාදීමට නියමිත ඇ.ඩො. බිලියන 4.5ක ආධාර ප්‍රමානය අවදානමකට ලක් කිරීමක් ශ්‍රී ලංකාවට දරාගත නො හැකි වනු ඇතැයි අනතුරු ඇඟවී ය. "දේශපාලන අර්බුදයෙන් ඍජු විදේශ ආයෝජනයන් හා විදේශ ආධාර ගලා ඒම අඩාල වුවහොත් ලබන අප්‍රේල් වන විට මුදල් ගලායෑමේ දැවැන්ත අර්බුදයකට අපට මුහුන දෙන්නට සිදුවන්නේ යැයි" මන්ඩලයේ සභාපති මහේන්ද්‍ර අමරසූරිය අනතුරු ඇඟවී ය.

කුමාරතුංග ශ්‍රීලනිපය ඇතුලතින් සහ එහි මිතුරන්ගේ - ලසසප සහ ශ්‍රීලංකොප - නොනවතින විවේචනයන්ට මුහුන දී සිටී. ලසසප නායක බැටී වීරකෝන් මෙම ගිවිසුමේ අන්තර්ගත වන්නේ ,පුරසාරම් සහ වැදගැම්මකට නැති කතා, බවත් එය මේ රටේ දැවෙන ප්‍රශ්නයට "පිලිතුරු සෙවීමට" උත්සාහ දරා නැති බවත් පැවසී ය. ශ්‍රීලකොප බලය බෙදා හැරීම සම්බන්ධයෙන් ශ්‍රීලනිපයේ යෝජනාවන් පිලිගන්නා ලෙස ජවිපෙන් ඉල්ලා සිටිය ද ඔවුන්ගේ සැලකිල්ල වැඩි වසයෙන් යොමු වූයේ සන්ධානයේ විධායක මන්ඩලයෙහි සිය නියෝජනය වැඩි කර ගැනීමට ය. පක්ෂ දෙක ම ජවිපෙ සම්බන්ධිතව කිසිදු මූලධර්මාත්මක ආස්ථානයක් ගෙන නොමැති අතර සන්ධානය එක එල්ලේ වැලඳ ගැනීමට ද නො පැකිලෙනු ඇත.

ඉදිරියට ඇති දින හා සතිවල දී ආන්ඩුවේ හා විපක්ෂයේ ක්‍රියාකලාපය කෙසේ වේ දැයි මොන ම ආකාරයකින් වත් නිශ්චිත නැත. ජවිපෙ-ශ්‍රීලනිප සන්ධානය ගොඩනැගීම මගින් දැනටමත් දැඩි ලෙස අස්ථාවර දේශපාලන තත්වයක තවත් එක් නොදන්නා සාධකයක් එක්කොට ඇත. පැහැදිලි එක ම දෙය නම්, මේ එකදු පක්ෂයකට වත් රටේ බහුතර වැඩ කරන ජනතාව මුහුන දෙන සැබෑ ප්‍රශ්නයන්ට - සාමයේ අවශ්‍යතාව, මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්, හොඳ ජීවන තත්වයක් - කිසිදු විසඳුමක් නොමැති බව පමනි.

© www.wsws.org